# සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර

**"ස්වාධීනව අයිති සහ ස්වාධීනව ක්‍රියාත්මක වන, එසේම ක්ෂේත්‍රය තුළ බලයක් හිමි නොවූ ව්‍යාපාර" කුඩා ව්‍යාපාර ලෙස හඳුන්වයි.**

**-ඇමෙරිකා එක්සත් ජනපදයේ කුඩා ව්‍යාපාර පරිපාලන ආයතනය-**

**සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නිර්වචනය කිරීම සඳහා විවිධ ආයතන ගුණාත්මක මෙන්ම ප්‍රමාණාත්මක නිර්ණායක යොදා ගනියි.**

| ප්‍රමාණාත්මක නිර්ණායක | ගුණාත්මක නිර්ණායක |
|---|---|
| 1. ආයෝජිත ප්‍රාග්ධනය<br>2. භාවිතා කරන බලශක්ති ප්‍රමාණය<br>3. සේවක සංඛ්‍යාව<br>4. වාර්ෂික පිරිවැටුම<br>5. ස්ථාවර වත්කම්<br>6. නිෂ්පාදන ධාරිතාවය | 1. ව්‍යාපාර කටයුත්තේ ස්වභාවය<br>2. භාවිත කරන තාක්ෂණය<br>3. වෙළඳපල ස්වභාවය<br>4. නිමවුමේ ස්වභාවය<br>5. සේවකයන් සමීපව සුපරීක්ෂණය කිරීමේ හැකියාව<br>6. කළමනාකරණ ශිල්පක්‍රම |

| ආයතනය | නිර්ණායකය |
|---|---|
| ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව | "සේවක සංඛ්‍යාව 25 ට අඩු ව්‍යාපාර" - |
| ශ්‍රී ලංකා මහ බැංකුව | "භාවිත කරන විදුලිබල ඒකක සංඛ්‍යාව 50kWA ට අඩු ව්‍යාපාර" |
| ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය | "ස්ථිර සේවක සංඛ්‍යාව 50ට අඩු, යන්ත්‍රසූත්‍ර හා ගොඩනැගිලි වටිනාකම මිලියන 4ට නොඅඩු ව්‍යාපාර" |
| කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය | "ඉඩම් ගොඩනැගිලි හැර ආයෝජිත ප්‍රාග්ධනය මිලියන 20 ට අඩු ව්‍යාපාර" |
| කාර්මික සංවර්ධන මණ්ඩලය | "ඉඩම් හා ගොඩනැගිලි හැර ස්ථාවර හා කාරක ප්‍රාග්ධනය මිලියන 4 නොඉක්මවන ව්‍යාපාර" |
| කාර්මික තාක්ෂණ ආයතනය | "යොදා ඇති ප්‍රාග්ධන ආයෝජනය මිලියන 4 නොඉක්මවන ව්‍යාපාර" |
| කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව | "ආරම්භක ප්‍රාග්ධනය මිලියන 4 නොඉක්මවන ව්‍යාපාර" |
| අපනයන සංවර්ධන මණ්ඩලය | "යන්ත්‍රෝපකරණ වල ආයෝජිත ප්‍රාග්ධනය මිලියනක් නොඉක්මවන ව්‍යාපාර" |

<u>ව්‍යාපාර සුළු හා මධ්‍ය පරිමාණ ලෙස වෙන් කොට හඳුනා ගැනීමේ අවශ්‍යතාව</u>

- මූල්‍ය පහසුකම් සැපයීම
- දළ දේශීය නිෂ්පාදිතයට ලබා දෙන දායකත්වය අගය කිරීම.
- දේශීය හා විදේශීය විවිධ ආයතන වලින් ලබා දෙන විවිධ පහසුකම් නිශ්චිත වශයෙන්ම අදාළ ව්‍යාපාර වලට ලැබෙන බව තහවුරු කිරීම.
- බදු විරාම, බදු සහන ලබා දීමට
- ව්‍යාපාර සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්ති නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට
- සම්පත් බෙදී යාමේ විෂමතාව අවම කිරීමට රජයේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වල ලක්ෂණ

1. සුළු ප්‍රාග්ධන ආයෝජනයක් සහිත වීම.
2. අඩු සේවක සංඛ්‍යාවක් සිටීම.
3. පවුලේ ශ්‍රමය වැඩි වශයෙන් භාවිත කිරීම.
4. කළමනාකරණය ස්වාධීන වීම අයිතිකරුම බොහෝ විට කළමනාකරු වීම.
5. තනි පුද්ගල ව්‍යාපාර ලෙස බොහෝ විට ව්‍යාප්ත වීම.
6. වෙළඳපල බොහෝ විට දේශීය වීම.
7. නවීන තක්ෂණය භාවිතය අඩු වීම.
8. ආයෝජනයට සාපේක්ෂව ලැබෙන ප්‍රතිලාභය කුඩා වීම.
9. සාපේක්ෂව කුඩා වෙළඳපල කොටසක් හිමි වීම.

රටක ආර්ථික සංවර්ධනයට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වල දායකත්වය

1. ශ්‍රම සුක්ෂම කර්මාන්ත බැවින් වැඩි රැකියා ප්‍රමාණයක් බිහි කිරීම.
2. ජාතික නිෂ්පාදිතය වර්ධනයට දායක වීම.
3. දේශීය සම්පත් භාවිතා කිරීම.
4. ප්‍රාදේශීය සංවර්ධනයක් ඇති වීම හා නාගරීකරණය නිසා ඇතිවන ගැටළු අවම වීම.
5. ආදායම් ව්‍යාප්ති විෂමතා අවම වීම.
6. මහාපරිමාණ ව්‍යාපාර වලට අවශ්‍ය අමුද්‍රව්‍ය සැපයීම.
7. වෙළඳපල තරගකාරිත්වය වර්ධනය වීම.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වලට ව්‍යවසායකත්වයේ වැදගත්කම

1. ව්‍යාපාර ආරම්භ කිරීම අවධානම් සහිතය. නමුත් ව්‍යවසායකත්වය මගින් අවධානම් කළමනාකරණය කරයි.
2. ව්‍යවසායකයාගේ කැපවීම හා උනන්දුව මත ව්‍යාපාරය දියුණු කල හැකි වීම.
3. ව්‍යවසායකයාගේ ආත්ම විශ්වාසය හා අධිෂ්ඨානය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වල සාර්ථකත්වයට බලපායි.
4. ව්‍යවසායකයා තුළ ඇති ව්‍යවසායකත්ව නිපුණතා වර්ධනය කර ගැනීම තුළින් ව්‍යාපාර සාර්ථක කර ගැනීමට හැකිවීම.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයක් ආරම්භ කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු

1. තම හැකියා සහ දක්ෂතා පිළිබඳ අධ්‍යනය කිරීම.
2. නිෂ්පාදිතයට ඇති වෙළඳපල හා එම වෙළඳපලට ලඟා විය හැකිද යන්න පිළිබඳ අධ්‍යනය කිරීම.
3. ව්‍යාපාර සංවිධාන ක්‍රමය පිළිබඳව අධ්‍යනය කිරීම.
4. පවත්නා නීතිරීති පිළිබඳව අධ්‍යනය කිරීම.
5. තමා සතු සම්පත් අගය කිරීම.
6. ව්‍යාපාරය ස්ථානගත කිරීම.
7. අවශ්‍ය වන ස්ථාවර හා කාරක ප්‍රාග්ධන අවශ්‍යතා
8. නිෂ්පාදන ශිල්පක්‍රමය
9. රාජ්‍ය අනුග්‍රහය
10. සේවක අවශ්‍යතා පිළිබඳ අධ්‍යනය කිරීම.

**සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සාර්ථක-අසාර්ථක වීමට බලපා ඇති කරුණු**

| සාර්ථක වීමට බලපා ඇති කරුණු | අසාර්ථක වීමට බලපාන කරුණු |
|---|---|
| ❖ ප්‍රමාණවත් යටිතල පහසුකම් පැවතීම.<br>❖ මූල්‍ය හා බදු සහන වැනි දිරිගැන්වීම්.<br>❖ පුළුල් වෙළඳපලක් පැවතීම.<br>❖ විවිධ ආයතනික හා අලෙවි පහසුකම්<br>❖ ලබා දීම.<br>❖ දක්ෂ කළමනාකරණයක් පැවතීම.<br>❖ ව්‍යාපාරිකයාගේ උනන්දුව හා කැපවීම. | ❖ මූල්‍ය හා ප්‍රාග්ධන දුෂ්කරතා පැවතීම.<br>❖ වෙළඳපල තරඟකාරිත්වයට මුහුණ දීමට නොහැකිවීම.<br>❖ ආනයනික භාණ්ඩ වලින් එල්ලවන තරඟය.<br>❖ ව්‍යවසායකත්ව හැකියා අඩු වීම.<br>❖ යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම.<br>❖ නව තාක්ෂණික දැනුම අඩු වීම.<br>❖ ව්‍යාපාරික ඥානය මදිකම.<br>❖ ප්‍රමාණවත් සහන නොලැබීම<br>❖ පුහුණු ශ්‍රමය හිඟකම<br>❖ නොගැළපෙන ස්ථාන වල ව්‍යාපාර ස්ථානගත කිරීම.<br>❖ කළමනාකාරිත්ව දුර්වලතා<br>❖ අමුද්‍රව්‍ය සපයාගැනීමේ දුෂ්කරතා |

ඉහත සඳහන් කල සුළු ව්‍යාපාර අසාර්ථක වීමට බලපාන කරුණු බොහොමයක් හේතුවෙන් ශ්‍රී ලංකාවේ බොහෝ සුළු ව්‍යාපාර ආරම්භ කොට කෙටි කලකින් වැසී යයි.

**සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් මුහුණ දී ඇති ගැටළු අවම කිරීමට ගතහැකි ක්‍රියාමාර්ග**

1. මනා වෙළඳපල පර්යේෂණයකින් හා ශක්‍යතා අධ්‍යනයකින් පසු ව්‍යාපාර ආරම්භ කිරීම.
2. ව්‍යාපාර කටයුත්ත පිලිබඳ ගැඹුරට අවබෝධ කරගෙන සිටීම.
3. තමා සතු සම්පත් පිලිබඳ නිවැරදි ඇගයීමක් සිදු කිරීම.
4. සැළසුමකට අනුව ව්‍යාපාරික කටයුතු සිදු කිරීම.
5. සම්පත් මනා ලෙස කළමනාකරණය කිරීම.
6. වෘත්තීය පුද්ගලයින්ගේ උපදෙස් ලබා ගැනීම.

❖ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හා මහා පරිමාණ ව්‍යාපාර අතර අන්තර් සබඳතාවක් පැවතීම දෙපාර්ශ්වයේම සාර්ථකත්වයට හේතු වේ. බොහෝ මහා පරිමාණ කර්මාන්ත තම යෙදවුම් ලෙස භාවිත කරන්නේ කුඩා කර්මාන්තවලින් බිහි කරන නිමැවුම් ය. කුඩා පරිමාණ ව්‍යාපාර වලට එම අමුද්‍රව්‍ය හා උපාංග අඛණ්ඩව සැපයීමට හැකි නම් මහා පරිමාණ නිෂ්පාදන ද අඛණ්ඩව පවත්වාගෙන යා හැකිය. එම නිසා කුඩා ව්‍යාපාර සඳහා වෙළඳපලක් නිර්මාණය වන අතර එය දෙපාර්ශ්වයේම ප්‍රගතියට හේතුවේ. එසේම කුඩා කර්මාන්ත බොහෝ විට මහා පරිමාණ කර්මාන්ත අත නොගසන ව්‍යාපාර ක්ෂේත්‍ර කරා යොමු වීම නිසා මහා පරිමාණ ව්‍යාපාර සාර්ථකව ක්‍රියාත්මක වන පරිසරය තුලම කුඩා ව්‍යාපාරද සාර්ථකව පවත්වාගෙන ය හැකිය. මහා පරිමාණ ව්‍යාපාරිකයන්ගෙන් ඔවුන්ට තරඟයක් ඇති නොවීම එයට හේතුවයි.

**සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සදහා ලබා දෙන දිරිගැන්වීම**

**සුළු හා මධ්‍යපරිමාණ ව්‍යාපාර සදහා දිරිගැන්වීම ලබා දෙන ආයතන ප්‍රධාන වශයෙන් වර්ග දෙකකි.**

1) රාජ්‍ය ආයතන
2) රාජ්‍ය නොවන/ වෙනත් ආයතන (සර්වෝදය, පෞද්ගලික බැංකු, සණස)

**සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, දිරිගැන්වීම සදහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග**

**සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සදහා රජයේ දිරිගැන්වීම් ප්‍රධාන ආකාර දෙකකි.**

1. **මූල්‍යමය දිරිගැන්වීම්**
   a. කෙටි හා දිගුකාලින ණය
   b. මූල්‍යමය ආධාර
   c. බදු විරාම
   d. බදු ඉවත් කිරීම්
   e. ප්‍රතිමූල්‍ය පහසුකම්

2. **මූල්‍යමය නොවන දිරිගැන්වීම්**
   a. උපදේශන සේවා
   b. අලෙවි පහසුකම්
   c. යටිතල පහසුකම්
   d. ව්‍යවසාය සංවර්ධන වැඩසටහන්
   e. පර්යේෂණ හා තාක්ෂනික සේවා
   f. සම්මාන හා උපහාර පිදීම්

| ලබා දෙන පහසුකම් | ලබා දෙන ආයතන |
|---|---|
| උපදේශන පහසුකම් | ▪ කාර්මික සංවර්ධන මණ්ඩලය<br>▪ අපනයන සංවර්ධන මණ්ඩලය<br>▪ ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය<br>▪ ශ්‍රී ලංකා ව්‍යාපාර සංවර්ධන මධ්‍යස්ථානය<br>▪ ජාතික ඇසුරුම් මධ්‍යස්ථානය |
| පර්යේෂණ හා තාක්ෂණික සේවා | ▪ ශ්‍රී ලංකා ප්‍රමිත ආයතනය<br>▪ කාර්මික තාක්ෂණ ආයතනය<br>▪ ජාතික ඉංජිනේරු පර්යේෂණ ආයතනය<br>▪ ජාතික මෝස්තර මධ්‍යස්ථානය |
| අලෙවි පහසුකම් | ▪ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව මණ්ඩලය<br>▪ හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල)<br>▪ කාර්මික සංවර්ධන මණ්ඩලය (ලක් නිපැයුම්)<br>▪ අපනයන සංවර්ධන මණ්ඩලය |
| මූල්‍ය පහසුකම් | ▪ ව්‍යවසායකත්ව ප්‍රාග්ධන සමාගම්<br>▪ ජාතික සංවර්ධන බැංකුව<br>▪ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු<br>▪ වාණිජ බැංකු |
| යටිතල පහසුකම් | ▪ ලංකා ආයෝජන මණ්ඩලය<br>▪ කාර්මික සංවර්ධන මණ්ඩලය<br>▪ සී/ස යටිතල පහසුකම් සමාගම<br>▪ කර්මාන්ත සංවර්ධන අමාත්‍යංශය |

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වල සාර්ථකත්වය සඳහා වූ ව්‍යාපෘති

1. ලිය ඉසුර (කාන්තා ක්ෂුද්‍ර ව්‍යවසාය ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය)
   සුරැකුම් රහිතව කාරක ප්‍රාග්ධන සහය සැපයීම අරමුණු කරගෙන ප්‍රාදේශීය ග්‍රාමීය බැංකු හරහා ක්‍රියාත්මක වේ.

2. සුවන (කුඩා කර්මාන්ත නායකත්ව සහ ප්‍රවර්ධන වැඩසටහන) SMILE
   අන්තර්ජාතික සහයෝගිතාව සඳහා වූ ජපාන බැංකුවේ අනුග්‍රය ඇතිව ජාතික සංවර්ධන බැංකුව ප්‍රතිමූල්‍ය පහසුකම් සපයමින් ක්‍රියාත්මක කරයි.

3. සහන්‍යා
   සුළු පරිමාණ ව්‍යාපාරිකයන්ට ණය සැපයීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ අනුග්‍රයෙන් DFCC හා අනිකුත් වාණිජ බැංකු සම්බන්ධ වෙමින් ක්‍රියාත්මක වේ.

4. සණස ණය ව්‍යාපෘතිය
   කෘෂි, සත්ත්ව, කුඩා කර්මාන්ත, වෙළඳාම සහ වාණිජ කටයුතු සඳහා ණය සපයන යෝජනා ක්‍රමයකි. ජාතික සංවර්ධන භාරකාර අරමුදල සහ සාමාජික තැන්පතු මේ සඳහා යොදා ගැනෙන අතර සණස මහා සංවර්ධන සංගමය විසින් පරිපාලන කටයතු සිදු කරයි.

5. සමුපාකාර ග්‍රාමීය බැංකු ණය
   කෘෂි, සත්ත්ව, කුඩා කර්මාන්ත, වෙළඳාම සහ වාණිජ කටයුතු සඳහා ණය සපයන යෝජනා ක්‍රමයකි. ජාතික සංවර්ධන භාරකාර අරමුදල සහ සාමාජික තැන්පතු මේ සඳහා යොදාගැනෙන අතර විවිධ සේවා සමුපාකාර සමිති සහ සමුපාකාර සංවර්ධන දෙපාර්තමේන්තුව පරිපාලන දායකත්වය ලබා දෙයි.

6. ගොවිජන බැංකු නියමු ව්‍යාපෘතිය
   ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘතියකි. වගා කටයුතු සඳහා කෙටි හා දිගුකාලින ණය ලබා දෙයි. කෘෂිකර්ම අමාත්‍යාංශයේ පිහිටුවා ඇති ගොවීන්ගේ භාරකාර අරමුදල හා සාමාජික තැන්පතු මේ සඳහා යොදා ගනියි.

7. සමෘද්ධි දිවි නැගුම සංවර්ධන ණය යෝජනා ක්‍රමය
   සමෘද්ධි/ දිවිනැගුම බැංකු හරහා සමෘද්ධිලාභීන් වෙත ණය දීම සහ අනෙකුත් සේවා සැපයීම මෙමගින් සිදු කරයි.

8. නව සපිරි ණය යෝජනා ක්‍රමය
   සුළු පරිමාණ ගොවීන්ට කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා ණය සැපයේ.

9. SMED ව්‍යාපෘතිය (සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධකයෝ ව්‍යාපෘතිය)
   සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ශක්තිමත් කිරීම, රැකියා අවස්ථා ඇති කිරීම, අපනයන සංවර්ධනය තුළින් විදේශ විනිමය ඉපයීම, රටා පුරා කර්මාන්ත ව්‍යාප්ත කිරීම ආදී අරමුණු ඉටු කර ගැනීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි.

10. SEEDS ණය යෝජනා ක්‍රමය / සර්වෝදය ආර්ථික ව්‍යවසාය සංවර්ධන සේවා
    සුළු පරිමාණ ව්‍යාපාරිකයින්ට සර්වෝදය බැංකු හරහා ණය සැපයීම මේ යටතේ සිදුවේ.

**11.** <u>සුරතුර</u>

සුළු ව්‍යවසායකයින්ට ණය සැපයීම තුළින් ස්වයං රැකියා වර්ධනය කිරීම සඳහා ලංකා බැංකුව, මහජන බැංකුව, හැටන් නැෂනල් බැංකුව ක්‍රියාත්මක කරන ණය යෝජනා ක්‍රමයකි.

**12.** <u>නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය</u>

ආසියානු සංවර්ධන බැංකුව මගින් මුල්‍යකරණය සිදු කරන මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තෘතිය අධ්‍යාපන හා පුහුණු අමාත්‍යාංශය විසින් සිදු කරයි.

**13.** <u>ගැමි පුබුදුව</u>

හැටන් නැෂනල් බැංකුව විසින් ස්වයං රැකියා සඳහා ණය සැපයීමට ආරම්භ කල ව්‍යාපෘතියකි.

**14.** <u>කාන්තා රන්දිවි මග</u>

ලංකා බැංකුවේ කාන්තාව සඳහා වූ ණය යෝජනා ක්‍රමයකි.

**15.** <u>ගැමිර ණය යෝජනා ක්‍රමය</u>

ඇප රහිතව ණය සැපයීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකු විසින් ක්‍රියාත්මක කරන ණය යෝජනා ක්‍රමයකි.

**16.** <u>දිරිය ණය යෝජනා ක්‍රමය</u>

රාජ්‍ය උගස් හා ආයෝජන බැංකුව සහ කාර්මික සංවර්ධන මණ්ඩලය එක්ව ස්වයං රැකියා හා සුළු පරිමාණ ව්‍යාපාරිකයන්ට මුල්‍ය පහසුකම් සැපයීමේ අරමුණින් ක්‍රියාත්මක කරයි.

**17.** <u>SMERDP ණය / සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘතිය</u>

ජාතික සංවර්ධන බැංකුව විසින් ක්‍රියාත්මක කරයි.

**18.** <u>ග්‍රාමීය බැංකු නව්‍යතා ව්‍යාපෘතිය</u>

මහජන බැංකුව සහ GTZ ආයතනය මගින් ක්‍රියාත්මක කරයි.

A/L NOTE BOOK

All about AL Notes ready for GCE AL Examination

# DOWNLOAD

Notes

Short Notes

Unit Test Papers

Term Test Papers

**From**

[www.ALNoteBook.com](http://www.ALNoteBook.com)

## Your Ultimate Resource for GCE A/L Notes and Study Guides

"The A/L notebook website is a dedicated online platform designed to provide comprehensive study materials and notes specifically tailored for students preparing for the General Certificate of Education Advanced Level (GCE A/L) examinations for free. The website offers a wide range of resources, including detailed subject notes, past exam papers, practice questions, and study guides. These materials cover various subjects and are curated by experienced educators to ensure they align with the curriculum and exam requirements."